ජ්‍යොතිර්විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව

මෞලික සිද්ධාන්ත හා ශරීර විඥාන අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

# Certificate Course in Astrology

**Department of Maulika Siddhanta and Shareera Vignana**

**Faculty of Indigenous Medicine, University of Colombo**

**පාඨමාලා සංකේතය (Course Code) - HŌRĀ 2024 -1**

1. **පාඨමාලාවේ නම (Name of the Progamme)** ජ්‍යොතිෂ මූලධර්ම, ජන්මපත්‍ර සාධනය, සහ ආයුර්වේදය **(Principles of Astrology, Preparation of Horoscopes and Āyurveda)**

**පටුන (Contents)** **පිටු අංක (Page Numbers)**


1. **හැඳින්වීම හා පසුබිම (Introduction and Background) ……………………… 2-3**
2. **විෂය පරමාර්ථ (Subject Objectives) ……………………………………………. 3**
3. **පාඨමාලාවට ඇතුළත්වීමේ සුදුසුකම් (Eligibility to Entry into Programme)…. 4**
4. **පාඨමාලා ගාස්තු (Course Fee) …………………………………………………. 4**
5. **ලියාපදිංචි හා සහතිකපත්‍ර ගාස්තු (Registration and Certification Fee)…………. 4**
6. **අයදුම්පත් ගාස්තු (Application Fee) …………………………………………… 4**
7. **පාඨමාලා කාලය (Course Duration) …………………………………………….. 5**
8. **අධ්‍යයන මාධ්‍යය (Medium of Instruction) ………………………………….. 5**
9. **උපචාර ආකෘතිය (Mode of Conduct) ………………………………………… 5**
10. **අධ්‍යයන ක්‍රමවේදය (Teaching Methods)……………………………………. 5**
11. **ඇගයීම් ක්‍රමවේදය (Assessment Methods) ………………………………….. 5**
12. **දේශක මණ්ඩලය (Lecturers Panel) ……………………………………………5**
13. **අධ්‍යයන අන්තර්ගතය (Course Content) …………………………………….. 6**
14. **සහතික පත්‍ර ප්‍රදානය (Certificate Awarding) ………………………………... 6**
15. **පරිශීලනය කළ යුතු ග්‍රන්ථ (Recommended books) …………………………… 7**

## 1. හැඳින්වීම හා පසුබිම (Introduction and Background)

ජ්‍යොතිෂ ශාස්ත්‍රය, නක්ෂත්‍ර විද්‍යාව, තාරකා ශාස්ත්‍රය, හෝරා ශාස්ත්‍රය වැනි නාමීකරණයන්ගෙන් හැඳින්වෙන මෙම ශාස්ත්‍රය ග්‍රහ තාරකා මගින් ලෝකයට සහ ජීවියාට සිදුවන බලපෑම් විනිශ්චය කරනු ලැබේ. භාරතීය වෛදික සාහිත්‍යයේ ඉපැරණිම ග්‍රන්ථය වන ඍග්වේද සංහිතාවත් එමෙන් ම අථර්ව-වේද සංහිතාවත් ජ්‍යොතිෂයේ ඓතිහාසික සාධකයන්ට නිදසුන් ය. ඒ අනුව ජොතිෂය වූ කලී කාලය හා සූර්යයා පදනම් කරගත් දේවදායාදයක් ලෙසින් ද හැඳින්වේ. කාලය පිළිබඳ වෛදික මුනිවරුන් සතු ඥාන සම්භාරය අථර්ව-වේදයේ අන්තර්ගත 19.7 හා 19. 8 යන **නක්ෂතත්‍ර සූක්ත** නමින් යුත් යාග ගීතිකාවන් ගෙන් ප්‍රකට වේ. ඒ අනුව රාශි දොළහ, කාල නම් පුරුෂයාගේ ඒ ඒ ශරීරාංගයන්ට සම්බන්ධ කෙරේ. අඟහරු, සිකුරු, බුද, චන්ද්‍ර, රවි, බුද, සිකුරු, කුජ, බ්‍රහස්පති, සෙනසුරු යන ග්‍රහයන් පිළිවෙළින් මේෂ ආදි රාශි දොළහටත් මේෂ ආදි නවාංශකයන්ටත් අධිපති වන බව **වරාහමිහිරයේ** දක්වේ. මේෂ මිථුන, සිංහ, තුලා, කුම්භ, ධනු යන රාශි ක්‍රෑර රාශි බව ද වෘෂභ, කටක, කන්‍යා, වෘශ්චික, මකර, මීන යන රාශි සෞම්‍ය රාශි බව ද දක්වන **අග්නි පුරාණය, සෞම්‍ය ලග්නේතු සෞම්‍යස්සාත් - ක්‍රෑරසාත් ක්‍රෑර ලග්නකේ** යනුවෙන් සඳහන් කරන්නේ ක්‍රෑර රාශිවලින් මිනිසුන් සතු ක්‍රෑර ගතිපැවතුම් ඇති කරන බවත් සෞම්‍ය රාශිවලින් සෞම්‍ය ගති පැවතුම් ඇති කරන බවත් ය. එබැවින් ජ්‍යොතිෂය යනු ඉපැරණි වේදාංගයකි.

ජ්‍යොතිෂය හා ආයුර්වේදය අතර ද ඇත්තේ අවියෝජනීය වූ සම්බන්ධයකි. සාංඛ්‍ය ආදි ෂඩ් දර්ශන ශාස්ත්‍රයන්හි බලපෑම මත ආයුර්වේදයේ දක්වෙන පඤ්ච මහාභූත සංකල්ප ජ්‍යොතිෂය හා තදනුබද්ධ වේ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාශ යන පඤ්ච මහාභූත, පදනම් කරගෙන ආයුර්වේදයේ දක්වෙන ශාරීරික රෝග ස්වභාව හා චර්යා ලක්ෂණවලට බුද, චන්ද්‍ර, රවි, කුජ, ශනි, ගුරු ආදි ග්‍රහයන්ගේ දශා, බලපාන ආකාරය **වරාහමිහිරයේ** ප්‍රස්තාවනාවේ දක්වේ. ආයුර්වේදය ආයුෂ්‍ය හෙවත් චිරජීවනය පිළිබඳ විද්‍යාවක් වන්නා සේම ජ්‍යොතිර්වේදය ද මිනිසාගේ පරමායුෂ අවුරුදු 120 ක් ලෙසින් පෙන්වා දෙන අතර ජීවන චක්‍රය දශා නවයකට බෙදා ඒවා නැකත්වලට සම්බන්ධ කර දක්වන විද්‍යාවකි. පඤ්චමවේදය ලෙසින් ගැනෙන ආයුර්වේදය, කාලය නිරන්තරයෙන් චලනය වන්නා සේ ශරීරයේ ත්‍රිදෝෂ තත්ත්ව ද නිතර චලනය වන බව පෙන්වා දෙයි. අථර්ව-වේදයේ දක්වෙන **කාල සූක්තය** ද මෙහිලා වැදගත් වේ. ආයුර්වේදයට අනුව ඍතු විපර්යාස හේතුවෙන් **වාත්ත, පිත්ත, කළු** රෝග උච්චාවචනය වේ. චන්ද්‍රයා සෙම අධික වීමට බලපාන අතර සූර්යයා පිත අධික වීමට බලපායි. කුජග්‍රහයා, අක්මාව, රක්තය, පිත්ත උදෙසා බලපාන බව ප්‍රකාශ කරන ආයුර්වේදය, ශනි මාංශ පේශි දුර්වල වීමටත් සිකුරු, ශුක්‍ර ධාතුව හා වෘෂණ කෝෂ මෙන් ම ඩිම්බ ආදිය කෙරෙහි බලපාන බව පෙන්වා දී ඇත. විශේෂයෙන් **අෂ්ටාංගහෘද සංහිතාව** පෙන්වා දී ඇති දේවග්‍රහ, අසුරග්‍රහ, ගාන්ධර්වග්‍රහ ආදිය විෂයෙහි පූරපක්ෂයේ පැලවිය, තෙලෙස්වක, තුදුස්වක ආදි කාලහෝරා නිර්දේශ කර ඇත. මේ අනුව ජ්‍යොතිෂය හා ආයුර්වේදය අතර සම්බන්ධතාවයන් දකිය හැකි ය. ආයුර්වේදය ද දිව්‍යමය ප්‍රභවයකින් සමන්විත වන අතර භාරතීය දායාදයක් ලෙසින් ලංකාවට සම්ප්‍රාප්ත වූවකි.

කෙසේ වෙතත් භාරතීයන් අතර ඉතා ජනප්‍රියත්වයට පත් මෙම ශාස්ත්‍රය දේව භක්ත්‍යාදරයෙන් හැදෑරිය යුතු බව **පරාසර** ඍෂිවරයා පවසා ඇත. සූර්යයා පමණක් නොව අවශේෂ ප්‍රධාන ග්‍රහ තාරකාවන්ගේ

පිහිටීම හා චලනය ගණනය කිරීමෙන් සත්ත්වයාට ඇති වන බලපෑම් ශාස්ත්‍රානුකූලව පෙන්වා දීමට ජ්‍යොතිෂ ශාස්ත්‍රයට හැකියාව ඇත.

ක්‍රි. පූ. 1 වන සියවසයේ සිට ක්‍රි. වර්ෂ 1 වන සියවස් කාලයේ දී ක්‍රමානුකූලව සංවිධානය වී සංවර්ධනය වූ ජ්‍යොතිෂ ශාස්ත්‍රයේ ස්වර්ණමය යුගයන් ලෙස භාරතයේ **වික්‍රමාදිත්‍ය** හා **කණිෂ්ක** රාජ්‍යයන් හැඳින්වේ. සැබවින්ම මෙය ගණිත විද්‍යාත්මක නිර්මාණයකි. **වරහමිහිර** යනු වික්‍රමාදිත්‍ය රාජ සභාවේ විසූ නවරත්නයන්ගේ එක් අයෙකි. මහායානික භික්ෂු සම්ප්‍රදායයෝ මෙම අවධියේ දී ජ්‍යොතිෂය ව්‍යාප්ත කරන්නට වූහ.

ප්‍රාග්-මහින්ද යුගයේ බ්‍රාහ්මණයන්ගේ සම්ප්‍රාප්තියත් අනුරාධපුර යුගයේ බ්‍රාහ්මණ වංශික භික්ෂූන්ගේ ලංකාගමනයත් හේතුවෙන් ශ්‍රී ලංකාවේ මෙම ශාස්ත්‍රය මුල්බැස ගත්තේය. **රාමායණ** ආදියෙහි සඳහන් වන්නේ ලංකාවේ ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රය **රාවණ** යුගය දක්වා වූ ඈතකට විහිදී යන බවයි. විශේෂයෙන් මහාවිහාරික හා අභයගිරික සම්ප්‍රදායයන් තුළද මෙම ශාස්ත්‍රය ප්‍රවර්තනය වූ අතර බෙහෝ ඓතිහාසික පාරිවේණික ශිල්පායතනවල නිර්දේශිත විෂයමාලාවන්ගේ ප්‍රධාන අංගයක ද විය. ගර්භාෂයේ සිට මරණය දක්වාම වූ ජීවිතයේ විවිධ වැදගත් අවස්ථාවන්හි දී භාවිතයට ගැනෙන මෙම ශාස්ත්‍රය, වාස්තු විද්‍යාත්මක හා ගෘහනිර්මාණ ශිල්පීය කටයුතුවල දී භාවිතයට ගැනෙන අනිවාර්ය අංගයක් බවට පත් වී තිබේ.

මේ වන විට ලෝකයේ බෝහෝ රටවල ජනාදරයට හා විශ්වාසයට භාජනය වී ඇති ජ්‍යොතිෂ ශාස්ත්‍රය පිළිබඳ ප්‍රාමාණික විද්වතුන් රැසක්ම ලංකාව් ද විරාජමාන වන අතර එය යාන්තමින් අතගා ගත් දෛවඥයන්ගේ මූල්යෝත්පාදක ලාමක ක්‍රියාකලාප නිසා මේ ශාස්ත්‍රය යම් යම් අවිශ්වාසනීය තත්ත්වයන්ට ද භාජනය වෙමින් පවතී.

## 2. විෂය පරමාර්ථ (Subject Objectives)

පාඨමාලාව අවසානයේ විද්‍යාර්ථියා පහත සඳහන් හැකියාවන් ප්‍රදර්ශනය කරයි.

- ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රයේ ඓතිහාසික පසුබිම මෙන් ම හෝරා ශාස්ත්‍රයේ ඇති සාමාජීය, සංස්කෘතික හා විද්‍යාත්මක වටිනාකම් හඳුනාගනී.
- ජ්‍යොතිෂයට ආවේණික පාරිභාෂික ශබ්ද මාලාවේ ඇති සංස්කෘත අවබෝධකර ගනී.
- ලංකා පඤ්චාඞ්ග ග්‍රහස්ඵුට ලිත් පොත පරිශීලනය කිරීමට දැනගනියි.
- ග්‍රහ රාශි, පංචාංගය, භාව කාරකත්ව, නක්ෂත්‍ර ආදිය විමර්ශනය කරයි.
- ඒ ඒ ශරීරාංගයන්ට අධිපති ග්‍රහයන් හා ඔවුන්ගේ ස්වභාවය දැනගනියි.
- නිරයන ග්‍රහස්ඵුට විමර්ශනය කොට උපන් වේලාවට අනුව ජන්ම පත්‍රයක් සකසා එහි නවාංශක හා දශා ශේෂය ලියා දැක්වීමට කුශලතාව දක්වයි.
- ජන්ම පත්‍රයක සුබා’සුබ ඵලා’පල ප්‍රකාශ කිරීමට සාමාන්‍ය හැකියාවක් දක්වයි.

### 3. පාඨමාලාවට ඇතුළත්වීමේ සුදුසුකම් (Eligibility to Entry into Programme)

අධ්‍යයන පොදු සහතික පත්‍ර සමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම හෝ ඊට සමාන වෙනත් පිළිගත හැකි විභාගයක් සමත්ව තිබීම. ස්ත්‍රී පුරුෂ හෝ වයස් භේදයක් නැත.

### 4. පාඨමාලා ගාස්තු (Course Fee)

රු. 25,000. 00 කි. (සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණක් බඳවා ගැනේ. අය කරනු ලබන කිසිඳු මුදලක් කුමන හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලැබේ).

### 5. ලියාපදිංචි හා සහතිකපත්‍ර ගාස්තු (Registration and Certification Fee)

රු. 5000.00 කි.

### 6. අයදුම්පත් ගාස්තු (Application Fee)

රු. 2000. 00 කි. තොරතුරු දැන ගැනීමට අවශ්‍ය වන්නේ නම් **0743043993** අංකය අමතන්න. අයදුම් කරන ආකාරය හා පාඨමාලා විස්තර දැන ගැනීම පිණිස පහත සඳහන් වෙබ් අඩවියට පිවිසෙන්න. **https://fim.cmb.ac.lk/**

**<u>අයදුම් කරන පිළිවෙළ</u>**

**https://fim.cmb.ac.lk/** යන පීඨ වෙබ් අඩවියෙන් අයදුම්පත බාගත කරගෙන සම්පූර්ණ කරන්න. නිසිලෙස පිර වූ අයදුම්පත සහ ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතික යන මේවායේ සහතික කළ පිටපත් හා අයදුම්පත් ගාස්තු ගෙවූ රිසිට්පත ස්කෑන් කර head.bpsv@fim.cmb.ac.lk යන විද්‍යුත් ලිපිනයට **ඔක්තෝබර්** 28 දිනට පෙර ඊමේල් කරන්න.

ඉහත සඳහන් ලියකියවිලි සමග පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූප දෙකක්, **නියෝජ්‍ය ලේඛකාධිකාරි, දේශීය වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන්න. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **ජ්‍යොතිර්විද්‍යා සහතිකපත්‍ර පාඨමාලාව** ලෙස සඳහන් කරන්න.

අයදුම්පත්‍ර ගාස්තුව ලෙස සෑම දේශීය අයදුම්කරුවෙකු ම නියමිත මුදල ඕනෑම **මහජන බැංකු ශාඛාවකින්** 078-1001- 22268432 යන ගිණුම් අංකයට බැර කළ යුතු ය. තැන්පතු පතේ **හේතුව** යන ස්ථානයේ **3420046** ලෙස සඳහන් කරන්න. මෙම මුදල කිසිදු හේතුවක් මත අයදුම්කරුට නැවත ලබා නොදේ. සම්මුඛ පරීක්ෂණයෙන් පාඨමාලාව සඳහා බඳවා ගත් පසු ලියාපදිංචි ගාස්තු හා පාඨමාලා ගාස්තු එක්වර ඉහත ගිණුමට බැර කළ යුතු වේ.

## 7. පාඨමාලා කාලය (Course Duration)

පාඨමාලා කාලය දින 14 කි.

එනම් සති අන්ත දිනවල (**ඉරිදා**) පෙ. ව. 8. 00 සිට 11.00 දක්වා වන, පැය හතලිහක (40) කාල පරිච්ඡේදයක් අයත් වේ.

## 8. අධ්‍යයන මාධ්‍යය (Medium of Instruction)

සිංහල සහ ඉංග්‍රීසි

## 9. උපචාර ආකෘතිය (Mode of Conduct)

පාඨමාලා සම්බන්ධීකාරක, අංශාධිපති හා පීඨාධිපති යන අයගේ අධීක්ෂණය හා මාර්ගෝපදේශ යටතේ ආයතනික දේශන ශාලා තුළ ප්‍රායෝගික ව දේශන හා වැඩමුළු සම්මන්ත්‍රණ ආදිය පැවැත්වේ. අවශ්‍යතාවක් ඇති වුවහොත් පමණක් දේශන කිහිපයක් Zoom තාක්ෂණය ඔස්සේ online ක්‍රමයට පැවැත්වීමට ඉඩ ඇත.

## 10. අධ්‍යයන ක්‍රමවේදය (Teaching Methods)

ජ්‍යොතිර් විද්‍යාව සම්බන්ධයෙන් මනා ප්‍රවීණත්වයක් සහ හසල අත්දැකීම් බහුල, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන් විසින් පවත්වනු ලබන දේශන, පැවරුම්, සටහන්, හා සාකච්ඡා මාර්ගයෙන් දැනුම හා අවබෝධය ප්‍රායෝගිකව ලබා දෙනු ලැබේ. එමෙන්ම අදාළ වූ විට අධ්‍යයන දෘශ්‍යාධාර ද භාවිත කෙරේ. අවශ්‍ය වුවහොත් පමණක් විද්‍යුත් මාර්ගගත ක්‍රමවේදය (online) ද අනුගමනය කෙරේ.

## 11. ඇගයීම් ක්‍රමවේදය (Assessment Methods)

බහුවරණ ප්‍රශ්න 20 කින් ද (ලකුණු 20 කි), කෙටි පිළිතුරු ප්‍රශ්න හතරකින් (ලකුණු 40 කි), හා රචනා ශෛලීය ප්‍රශ්න දෙකකින් (ලකුණු 40 කි), සමන්විත පැය තුනක ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයිය යුතු වේ. සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු **50** කට නො අඩුව ලබා ගත යුතු ය. යම් හෙයකින් නියමිත දිනයට විභාගයට සහභාගි විය නොහැකි වුව හොත් ඒ අය වෙනුවෙන් වෙනත් අමතර විභාගයක් කිසිදු හේතුවක් නිසා හෝ පවත්වන්නේ නැත. පිළිගත හැකි හේතුවක් මත එවැන්නෙකුට ඊළඟ කණ්ඩායම සඳහා පැවැත්වෙන විභාගයට පෙනී සිටීමට අවකාශ ලැබේ. පිළිතුරු පත් නැවත සමීක්ෂණයට ද අවකාශ නැත.

## 12. දේශක මණ්ඩලය (Lecturers Panel)

අංශාධිපති, විෂය ප්‍රවීණයන්, සම්බන්ධීකාරක, සියලු උපදේශකවරුන් මෞලික සිද්ධාන්ත හා ශරීර විඥාන අධ්‍යයනාංශය, දේශීය වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය. මීට අමතර ව ජ්‍යොතිර් විද්‍යාව පිළිබඳ විශේෂඥ දැනුම ඇති විශ්ව විද්‍යාලයෙන් පරිබාහිර ජ්‍යොෂ්ඨ කථිකාචාර්යවරුන් ද අධ්‍යයන මණ්ඩලයට අයත් වේ.

## 13. අධ්‍යයන අන්තර්ගතය (Course Content)

| අනු අංක | දේශන මාතෘකාව (Lecture Topic) | කාලච්ඡේද (Allocation Time) |
|---|---|---|
| 1. | ජ්‍යොතිර් විද්‍යාව යනු කුමක් ද | 02 |
| 2. | ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රයේ ආරම්භය හා විකාශය මෙන්ම සංස්කෘත වාග්මාලාව | 04 |
| 3. | ජ්‍යොතිෂ්‍ය මූලධර්ම | 03 |
| 4. | ජ්‍යොතිෂයේ පදනම | 02 |
| 5. | ජ්‍යොතිෂ්‍ය හා සෞඛ්‍ය සංරක්ෂණය | 03 |
| 6. | ග්‍රහරාශි චක්‍රය | 03 |
| 7. | ජ්‍යොතිෂ පඤ්චාඞ්ග | 04 |
| 8. | ලංකා ග්‍රහස්ඵුට ලිතෙහි භාවිතය | 01 |
| 9. | ජන්ම පත්‍රයක් සැකසීමේ ක්‍රමවේද | 10 |
| 10. | ජන්ම පත්‍රයේ ග්‍රහ පිහිටුවීම හා දශා ශේෂය | 04 |
| 11. | ජන්ම පත්‍රය හා නවාංශක දැක්වීම | 02 |
| 12. | ජ්‍යොතිෂය හා සබැඳි අභිචාර විධි හා නවග්‍රහ ශාන්ති | 02 |

## 14. සහතික පත්‍ර ප්‍රදානය (Certificate Awarding)

පාඨමාලාව සාර්ථකව නිමා කොට විභාගයෙන් සාමාර්ථය ලත් සියලු විද්‍යාර්ථීන්ට කොළඹ විශ්ව විද්‍යාලය, මගින් සහතිකපත්‍ර පිරිනමනු ලැබේ. යම් හෙයකින් සහතික පත් ප්‍රදානය කරන දිනයේ සහභාගි වීමට නොහැකි වුවහොත් එම විද්‍යාර්ථීන්ට තමාට හිමි සහතික පත්‍රය, අධ්‍යයනාංශයේ පාඨමාලා සම්බන්ධීකාරක වෙතින් පසුව පහසු දිනයක පැමිණ ලබා ගත හැකි ය.

## 15. පරිශීලනය කළ යුතු ග්‍රන්ථ (Recommended books)


- අභිනව ලිත් හෝඩිය, සංස්කරණය, දසනායක ඒ. 1966 මොඩන් පොත් සහසමාගම, නුගේගොඩ.
- නක්ෂත්‍ර නිඝණ්ඩුව සංස්කරණය, විද්‍යාරත්න එම්. ජී., 1954, එම්. ඩී. ගුණසේන සහ සමාගම කොළඹ.
- වරාහමිහිර සංස්කරණය, අප්පුහාමි ඩී. ඩී. ජේ. 1918, රත්න පොත් වෙළෙන්දෝ, කොළඹ.
- සංස්කෘත බාලාදර්ශය, විද්‍යාසාගර කේ. එල්. වී. එස්., 1992, දකුණු ඉන්දියාව.
- ලග්න චන්ද්‍රිකාව, සුමනසාර හිමි ඊ. 2010, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
- විශ්මිත පලදෙන නවාංශකය, ගුණපාල 2000, කර්තෘ ප්‍රකාශනයකි. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, කොළඹ.
- පලාපල කීමේ ක්‍රම සහ විධි, ගුණපාල 2023, කර්තෘ ප්‍රකාශනයකි. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, කොළඹ.


| **පාඨමාලා සම්බන්ධීකාරක** | **අංශ ප්‍රධාන** |
| --- | --- |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය අශෝක ගුණසේකර | මහාචාර්ය එස්. පී. මොල්ලිගොඩ |
| මෞලික සිද්ධාන්ත හා ශරීරවිඥාන අධ්‍යයනාංශය | මෞලික සිද්ධාන්ත හා ශරීරවිඥාන අධ්‍යයනාංශය |
| දේශීය වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය | දේශීය වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| ඇමතුම් අංකය - 0743043993 | |